"මත්ලෝලියා", "කුඩ්ඩා" වැනි, සමාජයේ සිටින විවිධ කොටස් සම්බන්ධයෙන් මාධ්‍ය සිදුකරන ඇතැම් සෘණාත්මක ලේබල්කරණයන් ඔස්සේ සිදුවිය හැකි හානිය සම්බන්ධයෙන්, Ethics Eye අපි පෙන්වා දී ඇත්තෙමු. උදාහරණ ලෙසට ගන්නේ නම්, මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්ව හැඳින්වීම සඳහා, ඉහත කී ලෙසට "මත්ලෝලියා", "කුඩ්ඩා" යනාදී යෙදුම් භාවිතා කිරීම ඔස්සේ, ඔවුන්ව සමාජය තුළ වඩ වඩාත් කොන් වීමත්, පුනරුත්ථාපනයෙන් පසුව හෝ නැවත සමාජයට එක් වීමට බාධා පැමිණීමත් සිදුවිය හැක. එයද සමාජ ගැටලුවක් නොවන්නේ දැයි අප ඇසිය යුතු වේ.
කෙසේ නමුත්, කණගාටුවට කරුණ වන්නේ ඇතැම් මාධ්‍ය දිගින් දිගටම එවැනි යෙදුම් භාවිතා කිරීමයි. පහත දැක්වෙන අවස්ථාවන් ඊට නිදසුන් වේ.
එසේ නම්,
1) මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වීම යනු, සංකීර්ණ කරුණු හේතු කොට ගෙන ඇති වන, නිසි ප්‍රතිකාර සහ සහාය ඔස්සේ භාවිතා කරන්නාව මුදා ගත හැකි තත්වයක් මිස, හුදු මත්ද්‍රව්‍ය සඳහා "ලොල් වීමක්" නොවන හෙයින්, 'මත්ලෝලියා' වැනි යෙදුමක් ඔස්සේ, මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳවද වැරදි අදහසක් සමාජගත නොවන්නේ ද?
2) "මත්ලෝලියා" වැනි යෙදුම් වෙනුවට, "මතට ඇබ්බැහි වූවන්", "මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්" වැනි යෙදුම් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

